# සංසන්දනය

සාමන් රුෂ්ඩි මහතා අරුන්දතී රෝයි මහත්මිය වැන්නවුන් අතරට පසුගිය දා තුර්කි ජාතියෙක් ද එක්විය. ඒ 2006 සාහිත්‍යය පිළිබඳ නොබෙල් ත්‍යාගය දිනාගත් ඕහන් පමුක් මහතා ය. ඒ මහතාගේ නවකතා තුර්කි විරෝධී ස්ථාවරයක් ගන්නේ යැයි මතයක් වෙයි. නොබෙල් ත්‍යාගවල ද දේශපාලනයක් ඇත. විශේෂයෙන් ම සාහිත්‍යය හා සාමය පිළිබඳ නොබෙල් ත්‍යාගවල දේශපාලන භාරය වැඩි ය. සාහිත්‍යය පිළිබඳ නොබෙල් ත්‍යාගයෙහි මෙන් ම සාහිත්‍යය සඳහා ප්‍රදානයකෙරෙන බුකර් ත්‍යාගයෙහි ද මේ දේශපාලනය දැකගත හැකි ය. මෙයින් කියැවෙන්නේ සාහිත්‍යය පිළිබඳ නොබෙල් ත්‍යාගය සැමවිට ම ප්‍රදානයකෙරෙන්නේ දේශපාලනය පදනම්කරගනිමින් ය යන්න නො වෙයි.

සැමවිට ම දොශපාලනය පදනම්කරගනිමින් සාහිත්‍යය පිළිබඳ නොබෙල් ත්‍යාගය ප්‍රදානයකළහොත් එවිට නොබෙල් ත්‍යාගයෙහි ඊනියා විශ්වාසනීයත්වය නැතිවෙයි. නොබෙල් හෝ වෙනත් සාහිත්‍ය හෝ වෙනත් විෂයයක් සම්බන්ධයෙන් හෝ ත්‍යාගයක් පිරිනැමීමේ දී දේශපාලනයෙන් මුළුමනින් ම මිදෙන්නේ යැයි කීම මෙන් ම ඒ මුළුමනින් ම දේශපාලනය මත රඳන්නේ යැයි කීම ද අන්ත දෙකකි. නොබෙල් ත්‍යාග ප්‍රදානයෙහි යෙදෙන්නෝ ඒ අන්ත දෙකම බැහැරකරති. එහෙත් ඔවුහු අවසාන වශයෙන් ගත්කල බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සේවකයෝ වෙති. එබැවින් සමස්තයක් ලෙස ගත්කල නොබෙල් ත්‍යාග පිරිනැමෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් ඒ මත පදනම්ව බිහිකෙරෙන කෘති සඳහා ය.

එබැවින් 2006 වසරෙහි සාහිත්‍යය සඳහා නොබෙල් ත්‍යාගය තුර්කි විරෝධී පොතපත ලියන්නේ යැයි කියන පමුක් මහතාට (මා ඒ මහතාගේ එක් කෘතියක් හෝ කියවා නැති බැවින් අන්‍යයන් ඒ පිළිබඳ පළකර ඇති මත සඳහන්කිරීමට සිදුවෙයි.) හිමිවීම පිළිබඳ අප පුදුම වියයුතු නො වෙයි. මෙහි දී අපට අවධාරණයකිරීමට සිදුවන්නේ රුෂ්ඩි මහතාගේ මෙන් ම පමුක් මහතාගේ ද කෘතිවල කතාවක් ඇති බව ය. මිලාන් කුන්දේරා මහතා කෙසේ කීවත්, කෙටිකතාවක් හෝ නවකතාවක් හෝ ලිවීමේ දී තවමත් කතාවක් කීමට සිදුවෙයි. ඒ කතාව එක්කෝ සමාජීය කතාවක් වෙයි. එසේත් නැත්නනම් මනෝ විශ්ලේෂණීය වෙයි. එසේත් නැත්නම් වෙනත් කුමක් හෝ මත පදනම් වෙයි. ඒ කුමක් වුවත් එය අවසාන වශයෙන් ගත්කල බටහිර නිර්මාණයකෙරෙන යම්කිසි දැනුමක් මත පදනම් වෙයි. හුදු භාෂා ප්‍රයෝග මත පදනම්වන කෘතියක් නවකතාවක් ලෙස බිහිවීමට, මතු අනාගතයේ කෙසේ වෙතත් දැනට නම් ඉඩක් නැත.

කුන්දේරා මහතාගේ ව්‍යාපෘතිය දැනට අසාර්ථක වුවත් ඔහු නවකතාව අනෙක් ක්ෂෙත්‍රවලින් වෙන්කරගැනීමට දක්වන උනන්දුව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එකඟ ය. ඉදිරි කාලයෙහි දී භාෂා ප්‍රයෝග වෙනුවට වෙනත් කරුණක් පදනම්කරමින් නවකතාව අනෙක් ක්ෂෙත්‍රවලින් වෙන්වීමට ඉඩක් ඇත. තවමත් බටහිරයන්ට ප්‍රශ්නය වී ඇත්තේ මේ අනෙක් කරුණ (හෝ කරුණු) කුමක්දැයි නො දැනීම ය. එසේ අනෙක් ක්ෂෙත්‍රවලින් වෙන්වීම යනු නවකතාව තව තවත් සමාජය යහමග යැවීමෙන් ද වෙන්වීමක් වෙයි. එබැවින් ඉදිරිකාලයේ දී නවකතාව, විශේෂයෙන් ම කෙටිකතාව තව තවත් ජාතක කතාවෙන් ඈත්වීම ද නොවැළැක්විය හැකි ය.

කෙටිකතාව හා ජාතක කතාව අතර වෙනස්කම් තිබිය දී ම ඒ සංසන්දනයකර ඒ අතර සමාන බවක් ඇතැයි කීමට මාර්ටින් වික්‍රමසිංහ මහතා පෙළඹුණේ ඇයි? එයට ඇත්තේ එකම එක හේතුවක් පමණ ය. ඒ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආධිපත්‍යය ය. පසුගිය අවුරුදු පන්සියක කාලයක් තිස්සේ තම ආධිපත්‍යය දසත පතුරුවා ඇති බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හමුවේ අප වැනි රටවල උගත්තු විවිධ ආකාරයෙන් ඒ ආධිපත්‍යයට ප්‍රතිචාර දක්වති. ඇතැමුන් පෙන්වීමට තැත්කරන්නේ බටහිරයන් විසින් පසුගිය කාලයෙහි නිර්මාණයකෙරී ඇති දෑ අළුත් දෑ නොවන බවත් ඉතිහාසයෙහි අප සතුව එවැනි දෑ තිබී ඇති බවත් පෙන්වීම ය. එමගින් ඔවුන් කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යය පිළිගැනීම බව ඔවුන්ට අවබෝධ නො වෙයි.

මාර්ටින් වික්‍රමසිංහ මහතා ජාතක කතාව කෙටිකතාව සමග සංසන්දනයකර කෙටිකතාවෙහි ඇති යථාර්ථවාදය වැනි අංග ජාතක කතාවෙහි ද තිබූ බව පෙන්වීමට උත්සාහ ගත් අන්දමට අද ඇතැම්හු බටහිර නවකතාවෙහි හා

© Prof. Nalin De Silva

කෙටිකතාවෙහි ඇති අධියථාර්ථවාදය ද ජාතක කතාවෙහි ඇති බව පෙන්වීමට උත්සාහ දරති. ඇතැම්හු ඊනියා පශ්චාත්නූතනවාදී ලක්ෂණ ද ජාතක කතාවෙහි තිබූ බව පෙන්වීමට උත්සාහ ගනිති. ඒ සියල්ල ලෝක ආධිපත්‍යය දරණ චින්තනයට යටවීම නිසා කෙරෙන දෑ ය.

මෙය සාහිත්‍යයට පමණක් සීමාවූවක් නො වෙයි. ආර්ථික විද්‍යාවෙහි හෝ භෞතික විද්‍යාවෙහි ද මෙවැනි ප්‍රතිචාර දැකගත හැකි ය. බටහිරින් එන යම් දැනුමක් අප අතර ද කලින් තිබී ඇති බව පෙන්වීමට හෝ බුදුන් වහන්සේ ඒ දැනුම අවුරුදු දෙදහස් පන්සීයකට පෙර දේශනාකර ඇති බව පෙන්වීමට හෝ ගැනෙන උත්සාහ අපට දැකගත හැකි ය. එසේත් නැත්නම් ඇතැම්හු බෞද්ධ ආර්ථිකවිද්‍යාවක් හෝ බෞද්ධ දේශපාලන විද්‍යාවක් හෝ සූත්‍ර පිටකයෙන් සොයාගැනීමට උත්සාහකරති. බුදුන් වහන්සේ දේශපාලන විද්‍යාවක් හෝ ආර්ථික විද්‍යාවක් හෝ භෞතික විද්‍යාවක් හෝ නොව මනෝ විශ්ලේෂණයක්වත් දේශනා කර නොමැති බව බොහෝ දෙනාට නො වැටහෙයි.

අපේ ක්‍රමයෙහි පමණක් නොව අවුරුදු පන්සියයකට පෙර පැවති කිසිම ක්‍රමයක විෂය වෙන්කරගැනීමක් සිදුවිණි යැයි නොසිතිය හැකි ය. විෂය වෙන්කිරීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි අංගයකි. මෙහි දී යම්කිසිවකු එකල වෛද්‍ය විද්‍යාවක්, ගෘහ නිර්මාණශිල්පයක් ආදී වශයෙන් නොතිබිණි දැයි ප්‍රශ්නකිරීමට හැකි ය. එකල වෛද්‍යවරුන් සිටි බව සැබෑ ය. එහෙත් ඒ වෛද්‍ය විද්‍යාවෙහි වෙදකමට අමතර ව වෙනත් කරුණු ද විය. රෝගියකුගේ ශාරීරික යැයි කියන රෝගයක් සම්බන්ධයෙන් කරන වෙදකමක දී වුව ද මනස නොසලකා නොහරින ලදී. මිනිසකු යනු සිරුරක් පමණක් ඇත්තකු හෝ බටහිර වෛද්‍ය විද්‍යාවෙහි කෙරෙන ආකාරයට යම් අවයවයක් පමණක් සතු අයකු හෝ නොසලකා සමාජයෙහි වසන මිනිසකුට (වියුක්ත මිනිසකුට නො වෙයි) කරන ප්‍රතිකාරයක් අපේ වෙදකමෙහි දැකගත හැකි ය. බුද්ධදාස රජතුමා සම්බන්ධ කතාවල පමණක් නොව අපේ ජනකතාවල ද මේ සම්බන්ධ උදාහරණ ඇත.

අද ඇතැමුන්ට මහාවංශය යනු කුමක්දැයි යනුවෙන් ප්‍රශ්නයක් ඇති වී තිබෙන්නේ ද එක් අතකින් මේ වෙන් නොකිරීම හේතුකොටගෙන ය. එහි ඉතිහාසය ඇත. එහෙත් එය හුදු ඉතිහාස ග්‍රන්ථයක් නො වෙයි. ඒ හුදු ඉතිහාස ග්‍රන්ථයක් නොවුණ ද සිංහලයන්ට ඉතිහාසය පිළිබඳ හැඟීමක් ඇත අතීතයේ සිට ම තිබී ඇත. වෙනත් කිසිම ජාතියකට නොමැති ආකාරයෙන් වංශකතා සාහිත්‍යයක් අපට ඇත්තේ එබැවිනි. එහෙත් ඒ වංශකතා එකක්වත් මිනිසා යහමගට යොමුකළ යුතු ය යන්නෙන් බැහැර නො වී ය. මෙහි දී යහමග යනු නිවන්මගට යොමු වූ මගක් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. වාස්තවික යහමගක් යනුවෙන් යහමගක් නැත. ඕනෑම අයකු පවසන ඕනෑම යහමගක් අවසාන වශයෙන් ගත්කල යම්කිසිවකට සාපේක්ෂ වෙයි. සිංහල බෞද්ධයන්ගේ යහමග නිවන් මග හා බැඳෙයි.

බටහිර විද්‍යාවක් යනුවෙන් විද්‍යාවක් නැතැයි ද ඇත්තේ එකම විද්‍යාවක් පමණක් යැයි කියන්නවුන් පවා බටහිරයන් කැලෑ කොළ අඳින කාලයේ දීත් අප මේ ආකාරයෙන් සිටියේ යැයි කීමට පෙළඹෙන අයුරු අපි දැක ඇත්තෙමු. බටහිර විද්‍යාවක් යනුවෙන් විද්‍යාවක් නැතැයි කීමෙන් ම හෙළිවන්නේ ඔවුන් බටහිර ආධිපත්‍යයට යට වී ඇති බව ය. ඕනෑම දැනුම් පද්ධතියක් ගොඩනැඟෙන්නේ චින්තනයක් මත පදනම් වී ය යන දැනුම ඔවුන් සතු නො වෙයි. ඔවුහු ඒ බව පිළිගැනීමට ද අකමැති වෙති. එහෙත් ඔවුන් පිළිගන්නා බටහිර දැනුමට ම අනුව වුවත් ඒ ඒ ප්‍රවාද බිහිවීමේ දී යම් සුසමාදර්ශයක් මත පදනම් වීමට සිදුවෙයි. තෝමස් කුන් පඬිවරයා සුසමාදර්ශය (paradigm) පිළිබඳ අදහස ඉදිරිපත්කරමින් ප්‍රකාශකෙළේ එයයි.

මේ පිළිබඳ ව කලින් ද සඳහන්කර ඇති නමුත් ඇතැමුන්ට ඒ බව අමතක වී ඇතැයි සිතිය හැකි නිසා ඒ නැවත මතක්කිරීම අනුචිත නො වෙයි. කුන් පඬිවරයාට අනුව අයින්ස්ටයිනීය සුසමාදර්ශය නිව්ටෝනීය සුසමාදර්ශයෙන් වෙනස් වෙයි. බටහිර ජෛවීය විද්‍යාවන් තවමත් පදනම්වන්නේ නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ය. බටහිර ජෛවීය විද්‍යාවන් මත පදනම් වූ තාක්ෂණයක් වන බටහිර වෛද්‍ය විද්‍යාව ද එබැවින් ම තවමත් නිව්ටෝනීය සුසමාදර්ශය මත පදනම් වෙයි. අපට නැවත නැවතත් කීමට ඇත්තේ චින්තනය යන්න සුසමාදර්ශයට වඩා ගැඹුරු සංකල්පයක් බවත් එක චින්තනයක සුසමාදර්ශ කිහිපයක් තිබියහැකි බවත් සුසමාදර්ශය යනු කුමක් දැයි තේරුම්ගැනීමට නොහැකි අයට චින්තනය යන්න කිසිසේත්ම නොතේරෙන සංකල්පයක් බවත් ය.

© Prof. Nalin De Silva

එහෙත් මෙහි දී කිවයුත්තක් වෙයි. චින්තනය යනු කුමක්දැයි තේරුම්ගැනීමට සුසමාදර්ශය ගැන අවබෝධයක් තිබිය යුතු යැයි ඉහත සඳහන් දෙයින් ගම්‍ය නො වෙයි. ඇතැම්හු සුසමාදර්ශය යනු කුමක් දැයි අසාවත් නැතිව චින්තනය යන සංකල්පය තේරුම්ගනිති. ඔවුන්ට ඉන්පසු සුසමාදර්ශය යන්න ඉතා පහසුවෙන් ම තේරුම්ගැනීමට හැකිවෙයි. ඇතැම්විට චින්තනය යනු කුමක්දැයි තේරුම්ගැනීමට මුල දී නොහැකිවන අයෙක් සුසමාදර්ශය යන්න තේරුම්ගනිති. ඉහත සඳහන් දැයින් කියැවෙන්නේ සුසමාදර්ශය යනු කුමක්දැයි තේරුම්ගැනීමට නොහැකි අයකුට චින්තනය යන සංකල්පය තේරුම් ගැනීමට නොහැකි බව පමණ ය.

අප අපේ ප්‍රවාද නිර්මාණයකිරීමට උත්සාහගන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යයට එරෙහි ව ය. ඒ බව නැවත නැවතත් මතක්කරගැනීම වැඩදායක වෙයි. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට ද එරෙහිව අරගල කළහැක්කේ බටහිරින් ම නිර්මාණයකර අපට එවන මාක්ස්වාදය, පශ්චාත් මාක්ස්වාදය හෝ පශ්චාත්නූතනවාදය හෝ වෙනත් දැනුමක් පදනම්කරගනිමින් නො වෙයි. බටහිරයන්ගේ මතවාද මත පදනම් වී ඇතැම්හු වික්ටෝරියානු සුචරිතවාදයක් ගැන කතාකරති. වික්ටෝරියානු සුචරිතවාදය යන්න බටහිරයන් විශේෂයෙන් ම ඉංගිරිසින් විසින් එංගලන්ත ඉතිහාසයේ එක් අවධියක තිබූ සුචරිතවාදයක් හැඳින්වීම සඳහා යොදාගන්නා සංකල්පයකි. අද බටහිරයෝ මේ සුචරිතවාදයෙන් වෙන් වී වෙන ම සුචරිතවාදයක් අනුගමනයකරති. ඒ බටහිර වත්මන් සුචරිතවාදය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මත පදනම් වෙයි. අපේ ඇතැමුන් බටහිරයන් අනුකරණය කරමින් පසුගිය සියවසේ වික්ටෝරියානු සුචරිතවාදයක් පසුපස ගිය බව සැබෑ ය. එවැනි සුචරිතවාදයක් සිංහල බෞද්ධ සමාජයෙහි නොතිබූ බව ද සැබෑ ය. එහෙත් එයින් කියැවෙන්නේ පවුල් සංස්ථාව යනුවෙන් බටහිරයන් අතින් හැඳින්වෙන්න කඩා බිඳ දමන වත්මන් බටහිර සුචරිතවාදයක් අපේ ඉතිහාසයේ තිබූ බව නො වෙයි. එදා ඇතැමුන් වික්ටෝරියානු සුචරිතවාදය අනුකරණය කළ අන්දමට ම අද මෙරට ඇතැම්හු බටහිරයන් ම අනුකරණය කරමින් වික්ටෝරියානු සුචරිතවාදයට විරුද්ධ වෙති. මාර්ටින් වික්‍රමසිංහ මහතා කෙටිකතාව හා ජාතක කතාව සංසන්දනය කරමින් ජාතක කතාවේ බටහිර කෙටිකතාවේ අංග දුටු ආකාරයට මොවුහු අපේ ඉතිහාසයෙහි වැරදි සුචරිතවාදයක් දකිති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva